# මෙරට පොත්ගුල් සම්ප්‍රදාය බිහිවීමට බුදුදහමින් ලත් අනුබලය : ක්‍රිස්තු වර්ෂාරම්භය දක්වා

ආර්. ඒ. අයි. එස්. රණසිංහ,
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය.

## සාරාංශය

ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිට ක්‍රිස්තුවර්ෂාරම්භය දක්වා වූ කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ පුස්තකාල සම්ප්‍රදායක් බිහිවීමට බුදු සමයෙන් ලැබී ඇති දායකත්වය විස්තර කෙරේ.

## හැඳින්වීම

පොත්ගුල් යනු පොත් තැන්පත් කර තබන ස්ථානයි. එබැවින් කිසියම් රටක පොත්ගුල් බිහිවීමට නම් ලියැවුණු පොත් සම්භාරයක් තිබිය යුතුය. පොත් රචනය සඳහා වියත් පඬිවරුන් සිටිය යුතුය. වියත් පඬි පරපුරක් බිහි වනුයේ දියුණු අධ්‍යාපන රටාවක් මගිනි. අතීතයෙහි සෑම රටක ම මෙන් ම අධ්‍යාපනය වර්ධනය වූයේ යම් ආගමික සම්ප්‍රදායයක් සමඟිනි.[1]

මෙරට පොත්ගුල් සම්ප්‍රදාය බිහිවීම සඳහා පාදක වූ ඉහත සඳහන් කරුණු සඳහා බුදුදහමෙහි හා බුදුසසුනෙහි ඇති බලපෑම සහ සම්බන්ධතාවය පිළිබඳ සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණයි. මෙහි දී බුදුදහමින් ලත් අනුබලය මෙන් ම, භික්ෂූන් වහන්සේලාගේ මෙහෙවර, බෞද්ධ රාජධර්ම අනුව කටයුතු කළ සිංහල බෞද්ධ රජුන්ගේ මෙහෙවර පිළිබඳව ද අවධානය යොමු කරනු ලැබේ

ක්‍රිස්තු පූර්ව තෙවන සියවසෙහි දේවානම් පියතිස්ස (ක්‍රි.පූ. 250-210) රජුගේ රාජාභිෂේකයෙන් දහඅටවන වසරේ දී ඉන්දියාවේ දඹදිව සිට පැමිණි මිහිඳු මාහිමියන් විසින් බුදුදහම හඳුන්වා දීම[2] ඉහත සඳහන් සියලු කරුණු කෙරෙහි බලපාන ලද මූලික සිදුවීම විය. එහෙයින් එය මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම සිදුවීම ලෙස සැලකිය හැකිය. මිහිඳු මාහිමියෝ මෙරට ජනතාවට අලුත් ආගමක් පමණක් නොව, උසස් සංස්කෘතියක් ද හඳුන්වා දුන්හ. සිංහල භාෂාව සාහිත්‍ය භාෂාවක් ලෙසට පත්කර ලූහ. එහෙයින් මිහිඳාගමනය සිංහල බෞද්ධ සංස්කෘතියේ ආරම්භය මෙන් ම,



මෙරට පොත්ගුල් සම්ප්‍රදායයේ මුල බීජය රෝපණය කිරීම බව ද සැලකීම යුක්තිසහගතය.

## බෞද්ධ අධ්‍යාපනය

නව ආගමක් සමඟ අධ්‍යාපනයක් ලැබීමේ වරප්‍රසාදය ද මෙරට ජනතාව සතුවිය. ග්‍රන්ථ සම්භාරයක් රචනය කිරීමට සමත් වියතුන් බිහි කිරීමට පාදක වූ මෙරට බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භය බුදුසසුන පිහිටුවීමත් සමඟ බැඳී පවතී. බුදුසසුන මෙරට මුල්බැස ගැනීම සිදුවනුයේ යම් කලෙක මෙරට මව්පිය දෙදෙනෙකුට දාව මෙරට දී උපත ලැබුවෙකු මෙහිදී ම විනය ඉගෙන මෙහිදී ම විනය ඉගැන්වීමෙන් පසුව බව මිහිඳු මාහිමි දේවානම්පියතිස්ස රජුට දන්වා ඇත. ඒ අනුව උන්වහන්සේ පැවසූ පරිදි එයට සුදුසු වූ අරිට්ඨ හිමිට ථූපාරාමයේ දී විනය උගන්වා ඇත[3]

මෙලෙස ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපනයේ පුරෝගාමීන් මෙන් ම ආචාර්යවරුන් ද වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාය. අධ්‍යාපන මධ්‍යස්ථාන වූයේ පිරිවෙන්ය. බෞද්ධ අධ්‍යාපන රටාව සැකසී තිබුණේ ධාරණ ශක්තිය වර්ධනය වන අන්දමටය. පොත්පත් නොතිබූ එම යුගයේ ගණ සජ්ඣායනා කිරීම සහ සමූහ වශයෙන් ශිෂ්‍යයින් ලවා කටපාඩම් කරවීමේ ක්‍රමය ධාරණ ශක්තිය වර්ධනය කරලීමට සමත්විය.[4]

එම විධිමත් අධ්‍යාපන ක්‍රමය අනුව භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේ දෙසූ ධර්මය අන්තර්ගත සූත්‍ර, විනය, අභිධර්ම යන පිටක තුන ඇතුළත් ත්‍රිපිටකය ද, හෙළදිව ආචාර්යවරු විසින් හෙළ භාෂාවට පරිවර්තනය කරන ලද, ත්‍රිපිටකය ඉගෙන ගැනීමට මාගධී භාෂාවෙන් පැවති අට්ඨකථා ද මුඛ පරම්පරාවෙන් පවත්වා ගෙන ආහ.[5]

බෞද්ධ භික්ෂූන් වහන්සේලා තම පරම යුතුකමක් ලෙස සලකා දිවි පරදුවට තබා ත්‍රිපිටකය සහ හෙළටුවා මුඛ පරම්පරාවෙන් රැක ගැනීමට අප්‍රතිහත ධෛර්යයකින් හා නොපසුබට උත්සාහයෙන් ක්‍රියාකර ඇත. සතුරු උවදුරු, සැරළි, සාගත ආදිය පැවති කාලයන්හි උන්වහන්සේලා වනාන්තරවලට ද, දිවයිනේ වෙනත් පළාත්වලට ද, විදේශ රටවලට ද ගොස් එම ධර්මය ආරක්‍ෂා කර ඇත.[6]

මේ අන්දමට ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට සියවස් දෙකක් පමණ මුඛ පරම්පරාගතව රැකගෙන ආ ත්‍රිපිටකය සහ හෙළටුවා, ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස පමණ වනවිට තවදුරටත් මුඛ වචනයෙන් පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක්